සන්නස
SANNASA

# බක්මහ සූරියෙ උදානය

අටුකොටු පළබර වී ගහකොළ දළුලන වසන්ත සමය අප කාගෙත් සිත් සතන් අමන්දානන්දයට පත් කරන සතුටු සමයකි. සිංහල අවුරුදු උත්සවය වසන්තය සමඟ බැඳී, අප හදවත් තුළ පිපී, සුවඳ හමන්නේ සාමය සතුට හා එකමුතුකමින් පිරී විශෙෂිත උත්සවයක් ලෙසිනි. ලැව්ගිනි ඇවිලී ගහකොළ අළු වී ගිය ද, නැවත වැහි ඇද හැලී අතුපත් පිපී සැළෙන වසන්ත සමයට විප්‍රවාසීන් ලෙසින් අප ඇළුම්කමක් දක්වන්නේ ආදරය, සතුට සොයා යන මිනිස්කමෙන් පිරී මෙම දිගු ගමනක එක් ප්‍රතිඵලයක් ලෙසිනි.

අප මව්රටේ සිංහල අවුරුදු උත්සවයක් උත්සවශ්‍රීයෙන් සමරා ඇත්තේ මහනුවර යුගයේ දී ය. එයින් පසු ලක්වැසි සැවොම කිසිදු වාර්ගික බේදයකින් තොරව උත්සවශ්‍රීයෙන් සමරන එකම උත්සවය වන්නේ සිංහල, දෙමළ හා හින්දු අලුත් අවුරුදු උත්සවයයි. හිරු වන්දනාව මෙන්ම නැකැත් හා බැඳුණු අවුරුදු සිරිත් විරිත් සිංහල අවුරුද්දේ වටිනාම අංගයකි. මුළු පොළෝ තලයටම පායන හිරු ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා පුරවරයට ද පායන්නේ එනුවර වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ අලුත් බලාපොරොත්තු දල්වාලමිනි. මව් රටින් බැහැරව දිවි ගෙව්ව ද, මේ ඉර හඳ යට කොතැනක හෝ ජීවත් වන අපට අපේකම හා බැඳුණු සිංහල අලුත් අවුරුදු සිරිත් විරිත් අමතක කළ නොහැක්කේ එබැවිනි.

"එකමුතුකම තුළින් කළ නොහැක්කක් නොමැත" යන වදන ඔප්පු කරමින් වික්ටෝරියා ප්‍රාන්තයේ මෙල්බර්න් පුරවරයේ 2011 වසරේ බක් මස ආරම්භ වූ සූරිය උදාන සැණකෙළිය මේ වන විට දස වසරක අබිමන් ලබමින් මෙල්බර්න් අඹරේ නොමැකෙන සටහනක් තබා ඇත්තේ ඔබ අප සැම එකමුතුව ලබාගත් එම මහඟු උත්සහයේ ප්‍රතිඵලයක් ලෙසිනි. මෙල්බර්න් හි ක්‍රේසටසැඉමරබ නගරය මුල් කරගෙන ආරම්භ වූ මෙම බක්මහ සූර්ය උදානය අද වන විට එපෙදෙස ශ්‍රී ලාංකික අප ප්‍රජාව අතර විශේෂිත සිංහල අවුරුදු උත්සවයක් බවට පත් වී සැමගේ සිත් සතන් ප්‍රමෝදයට පත් කර ඇත්තේ පියවරෙන් පියවර ඉදිරියට ගිය දැඩි ධෛර්යවන්ත ගමනක සළකුණක් සටහන් කරමිනි. සිහලකමට අපේ සංස්කෘතියට ආදරය කරන සීයයකින් පමණ සමන්විත වූ ස්වෙච්ඡා සාමාජිකයන් පිරිසකගෙන් ආරම්භ වූ මෙම සැණකෙළිය උතුරු වික්ටෝරියානු සුබසාධන හා සංස්කෘතික සංගමය හා අනුබද්ධිතව දස වසරක් සම්පූර්ණ කර ඇති බව පවසන්නේ ඉතාමත් ආඩම්බරයෙනි. එය අද වන විට පන්දහසක් පමණ පිරිසක් සහභාගී වන දැවැන්ත අවුරුදු උත්සවයකි. මෙල්බර්න් පුරවරයේ ශ්‍රී ලංකික ප්‍රජා කටයුතුවලට ආධාර උපකාර කරන ව්‍යාපාරිකයන් හා අනෙකුත් ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සහයෝගය නොමැති නම් මෙම උත්සවය දසවසරක් පුරා ආ ගමන සිහිනයක් වන්නට ඉඩ තිබිණි.

පංචකෙළිය, ඔළිඳ කෙළිය, නෙරන්චි ඇදීම ආදී ජන ක්‍රීඩා අද වන විට අභාවයට ගිය ද, එවැනි ගෘහස්ත අවුරුදු ක්‍රීඩා නොමැති වුව ද, අනෙක් සැම එළිමහන් සිංහල අවුරුදු ක්‍රීඩාවන් රැසක් සමගින් ආලෝකමත් වන සූරිය උදානය විප්‍රවාසී මෙල්බර්න් ප්‍රජාවට වැදගත් වන්නේ තම ජීවිතයට එක් වන විශේෂිත මතක සටහනක් ලෙසිනි. කොට්ට පොර, කඹ ඇදීම, අලියට ඇස තැබීම, කනා මුට්ටිය බිඳීම, බනිස් කැම, ගෝනි රේස්, සිඟිති අවුරුදු කුමර කුමරියන් ඇතුළු තවත් බොහෝ ජන ක්‍රීඩා ඇතුලත් සූරිය උදාන සැණකෙළිය අවසාන වන්නේ එළිමහන් සංගීත සන්දර්ශනයක් සමගිනි. 2020 වසරේ දස වසරක අභිමානය සමගින් ඔබ සැම අවුරුදුප්‍රීතියෙන් හා උත්සවශ්‍රීයෙන් සහභාගී වන්නට සැදී පැහැදී සිටන සූරිය බක් මහ උදානය මෙම අප්‍රේල් මස 13 වන සඳුදා උදෑසන 9.00 සිට රාත්‍රී 9.00 දක්වා ***High Gate Recreation Reserve, Oval 2, Grand blnd, Craigieburn*** හිදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.




මෙතෙක් ආ ගමන් මගේ සාර්ථකත්වය ඇත්තේ අප හා රැඳී ඔබ මෙතෙක් ලබාදුන් අප්‍රතිහත ධෛර්යය හා සාපේක්ෂවය. සූරිය උදාන වත්මන් සභාපති චන්දන ඉඹුලාන, ලේකම් උපුල් චන්දන, භාණ්ඩාගාරික උදිත සිරිසේන, උත්සව සංවිධායක අසංග විතාරණගේ ඇතුලු සංවිධායක මණ්ඩලයට, ඔබ සැමගෙන් ඉල්ලා සිටින්නේ එදිනට සහභාගී වී, ජන ක්‍රීඩා ඇතුළු මෙම අවුරුදු උළෙල හා සම්බන්ධ වී උත්සවය වර්ණවත් කරන ලෙසිනි. බක්මහ සූරිය උදානය අපේම අවුරුදු උත්සවයක් ලෙසින්, විප්‍රවාසීව දිවි ගෙවන අප ජීවිතයට ආලෝකයක් ගෙන දෙන උසස් සංස්කෘතික ගුණාංග රැසකින් පිරි අපේම උත්සවයකි. එදින එයට අත්වැලක් වන මෙන් එම සංවිධායක මණ්ඩලය ඔබ සැමගෙන් ආදරයෙන් ඉල්ලා සිටී.

එදිනට අප ඔබ සැම හමුවෙමු. අපේකම තෙද රොද බැඳගත් සිංහල හෙළ සිරිත්වලින් පෝෂණය වූ මෙම අවුරුදු සමයේ ලාංකික අප සැම එකතුවී සිංහල අවුද්දේ කිරි උතුරා මුළු ලොවටම ලෙඩ දුක් කරදර යුද බියෙන් තොර සෞභාග්‍යමත් අනාගතයකට ආසිරි පතමු.

**ලක්ෂමන් කොඩිතුවක්කු**